# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1858/6 – 2014 අප්‍රේල් 17 වැනි බ්‍රහස්පතින්දා – 2014.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/22/26/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී.ටී. ලීලාරත්න මයා, හෙල්ලන්ද, අලුත්වෙල, හාලිඇල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මහනුවර, වටපුළුව, ජය මාවත, අංක. 53 හි, කේ. ආර්. එම්. එන්. ලෝරන්ස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/26/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ඩී.ටී. ලීලාරත්න මයා, හෙල්ලන්ද, අලුත්වෙල, හාලිඇල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ප්‍රධාන කාර්යාලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බණ්ඩාරවෙල ඩිපෝවේ, සහකාර කළමනාකාර ධාවන (ආවරණ) තනතුරේ සේවය කළ ඩී. ටී. ලීලාරත්න මහතාට 2008.08.27 දින බදුල්ල ප්‍රාදේශීය කාර්යාලයේ ජංගම පරික්ෂණ කණ්ඩායමක් ඩිපෝවට පැමිණි අවස්ථාවේදී කණ්ඩායමේ වාහනයට ඉන්ධන ලබා නොදීම සම්බන්ධයෙන් චෝදනා එල්ල කර විනය පරීක්ෂණයක් පවත්වා දඬුවම් කිරීම යුක්තිසහගතද ? එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මාර්තු මස 06 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05-40

---

මගේ අංකය: IR/15/12/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

පද්මා වේරගොඩ ආරච්චි මිය, නො. 30, රිචඩ් ද සොයිසා මාධ්‍ය නිවාස, තලංගම උතුර, බත්තරමුල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, තැ. පෙ. 248, ලේක් හවුස් මන්දිරය, කොළඹ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක. 03 හි, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/12/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

පද්මා වේරගොඩ ආරච්චි මිය, නො. 30, රිචඩ් ද සොයිසා මාධ්‍ය නිවාස, තලංගම උතුර, බත්තරමුල්ල

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, තැ.පෙ. 248, ලේක් හවුස් මන්දිරය, කොළඹ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය** වනුයේ,

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කළමනාකරණ කතුවරියක් ලෙස සේවය කරනලද පද්මා වේරගොඩ ආරච්චි මහත්මියට 2008, 2009, 2010, 2011 යන වර්ෂයන් සඳහා වැටුප් වර්ධක ලබා නොදීමෙන් ඇයට යම් අසාධාරණයක් සිදුවී තිබේද ? එසේ සිදුවී ඇත්තම් ඇයට ලබාදිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මාර්තු මස 05 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05-41

---

මගේ අංකය: IR/10/43/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව–

එක් පාර්ශ්වයක් වශයෙන්,

බී. එච්. ඒ. සිරිල් ගුණරත්න මයා, අංක 392/11, අළුත්ගම පාර, මතුගම.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා ඇමති, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක. 03 හි, ආර්. එස්. ආරියප්පෙරුම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2014 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/43/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

බී. එච්. ඒ. සිරිල් ගුණරත්න මයා, අංක 392/11, අළුත්ගම පාර, මතුගම.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයෙකු වන බී. එච්. ඒ. සිරිල් ගුණරත්න නමැති අයට ඔහුගේ වැඩ තහනම් කර සිටි කාලය වන 2002.04.09 දින සිට 2008.02.26 දින දක්වා කාලයට ඔහුට යම් හිඟ වැටුපක් හිමිවන්නේද? එසේ හිමිවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2014 මාර්තු මස 05 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05-42

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.